ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

<u>ඉන්දීය ප්‍රදාන යටතේ ඉදිකරන ලද 22වන ආදර්ශ ගම්මානය ගාල්ල දිස්ත්‍රික්කයේදී විවෘත කරේ</u>

2026 ඔක්තෝබර් 22 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය ගරු වෙද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ මැතිතුමා විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ 'දිදුල' ආදර්ශ ගම්මානයේ ඉදිකරන ලද නිවාස 24ක ප්‍රතිලාභීන් වෙත භාර දෙන ලදී.

2. ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ මෙම ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය සමඟින් එක්ව දිවයිනේ දිස්ත්‍රික්ක 25 තුළම ක්‍රියාවට නැංවේ. මෙම ව්‍යාපෘතිය සඳහා වන අවබෝධතා ගිවිසුමට ඉන්දීය සහ ශ්‍රී ලංකා රජයන් විසින් 2017 ඔක්තෝබර් මාසයේදී අත්සන් තබන ලදී.

3. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී පවුල් 600ක් සඳහා නිවාස ඉදිකරෙනෙ අතර ඒ අනුව දිස්ත්‍රික් නිවාස කමිටු විසින් එක් එක් දිස්ත්‍රික්කයනේ තෝරා ගන්නා පවුල් සඳහා නිවාස 24 බැගින් සමන්විත ආදර්ශ ගම්මාන ඉදි කරේ.

4. මේ වන විට දිස්ත්‍රික්ක 21ක ආදර්ශ ගම්මාන විවෘත කර ඇත. එම දිස්ත්‍රික්ක වන්නේ මඩකලපුව, වවුනියාව, යාපනය, මහනුවර, ගම්පහ, අනුරාධපුර, බදුල්ල, මාතලේ, පුත්තලම, කොළඹ, ත්‍රිකුණාමලය, මොනරාගල, කිලිනොච්චි, මන්නාරම, මුලතිවු, රත්නපුර, අම්පාර, කුරුණෑගල, කෑගල්ල, කළුතර සහ පොලොන්නරුව යි. ව්‍යාපෘතියේ ප්‍රගතිය 98.6%ක් වන අතර ඉතිරි ආදර්ශ ගම්මාන තුන ද ඉක්මනින්ම විවෘත කිරීමට අපේක්ෂිත ය.

5. 'දිදුල' ගම්මානය විවෘත කිරීමේ අවස්ථාව සඳහා දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ගාල්ල දිස්ත්‍රික් පරිපාලන නිලධාරීන් ඇතුළු රුසක් සහභාගී වූහ.

***

කොළඹ
2026 ඔක්තෝබර් *22*